ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
**National Secretariat for Elders**

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**

*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා* -செயலூக்கமான முதுமையை நோக்கி - *Towards an active ageing*

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. : NSE/DEV/ESSF/04/01 | ඔබේ අංකය / உனது இல. / Your No. | දිනය / திகதி / Date : 2025.04.23 |

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>වැඩිහිටියන්ට තම නිවස තුළ ජීවත් වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම.</u>**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින්, වැඩිහිටි ප්‍රජාවගේ සුබසාධනය ඉහළ නැංවීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ අතරින් "අවම පහසුකම්" වැඩසටහන 2025 වර්ෂයේ ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

02. ඒ අනුව තම නිවෙස්වල ජීවත්වීමේදී අවශ්‍ය කරන අවම පහසුකම් පවා අහිමිව පීඩාවට පත්ව සිටින වැඩිහිටියන් වෙසෙන එක් පවුලක් වෙනුවෙන් රු.100,000.00 ක උපරිම සීමාවකට යටත්ව මුදල් ආධාර ලබා දෙනු ලබන අතර, අවුරුදු 60 සම්පූර්ණ වූ, අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත ආධාර ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුකිරීමට අපේක්ෂිතය.

03. ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී ප්‍රමුඛතාව අනුපිළිවෙලට නාමලේඛණය සකස් කල යුතු අතර වැසිකිලි ඉදිකිරීම් හා නිවෙස් අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ප්‍රමුඛතාවය දිය යුතුය.

04. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ පහත සඳහන් ලේඛන මේ සමග ඉදිරිපත් කරන අතර, මෙම සියලුම ඇමුණුම් (01 සිට 04 දක්වා) www.srilankaeldercare.gov.lk වෙබ් අඩවියේ පලකෙරෙන බැවින් ඒ මගින් ද මෙම තොරතුරු ලබාගත හැකි ය.

- ඇමුණුම 01 - උපදෙස් පත්‍රිකාව
- ඇමුණුම 02 - ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය
- ඇමුණුම 03 - අදාළ ඉල්ලුම්පත්‍රය
- ඇමුණුම 04 - මුදල් ලබාදුන් බව දැන්වෙන වාර්තා ආකෘති පත්‍රය

05. ඉහත වැඩසටහන යටතේ පසුගිය වර්ෂයේ (2024) ඉල්ලීම් ඉදිරිපත්කර, මෙතෙක් ආධාර ලැබී නොමැති වැඩිහිටියන් අතුරින්, නව නිර්ණායක වලට අනුකූල ප්‍රතිලාභීන් සඳහා ඇමුණුම 02 ආකෘතිය මගින් නැවත ඉල්ලීම් කළයුතු වේ. මෙහිදී, එම ඉල්ලුම්කරුවන් විසින් ඔබ වෙත ඉදිරිපත්කර ඇති අයදුම්පත්‍රයම අදාළ කරගතයුතු අතර, නව අයදුම්පත්‍ර ලබාගැනීම අවශ්‍ය නොවේ.

06. මේ සඳහා සකස් කරන ලද උපදෙස් පත්‍රිකාව www.srilankaeldercare.gov.lk වෙබ් අඩවියේ පලකර ඇති අතර, ආධාර ලබාගැනීම සඳහා එම උපදෙස් අනුව අවශ්‍ය සියලුම තොරතුරු ඇතුළත් ඉල්ලීම මා වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

07. මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ. චතුර මිහිඳුම්
අධ්‍යක්ෂ

පිටපත :- සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - කා.දැ.ගැ. හා අ.ක.ස.

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
ගිණුම් අංශය : 0112054138